# ජී.එස්.පී බදු සහනය දීර්ඝ කර ගැනීම සඳහා කටයුතු කිරීමට ඇමැතිවරුන් 4කින් යුත් කමිටුවක්

## ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් දැනුම්දෙයි

(අමරදාස සිල්වා)

ජී.එස්.පී. ප්ලස් බදු සහනය සහ ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්ත්වය පිළිබඳව අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ මහා සංඝරත්නයේ උපදේශක කමිටුවේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා සංවිධානය කළ විශේෂ රැස්වීමක් අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේදී පසුගියදා පැවැත්විණි.

අපනයන සංවර්ධන සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය සහ වැඩබලන තැපැල් හා විදුලි සංදේශ ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් සහ අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ යන මහත්වරුන්ගේ ද සහභාගිත්වයෙන් එම රැස්වීම පැවැති අතර, රටට වාසි සහගත ජී.එස්.පී. ප්ලස් බදු සහනය දීර්ඝ කර ගැනීම සඳහා යුරෝපීය සංගමය හා සාකච්ඡා පවත්වන මෙන් එහිදී මහා සංඝරත්නය අමාත්‍යවරුන්ගෙන් ඉල්ලා සිටියහ.

මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අමාත්‍යවරුන් සිව් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබ ඇති බවත්, ශ්‍රී ලංකාවේ අභිමානය ආරක්ෂා වන පරිදි මේ පිළිබඳව අදාළ බලධාරීන් සමග සාකච්ඡා පවත්වන බවත් මහාචාර්ය ජී.එල්. පීරිස් අමාත්‍යවරයා විසින් මෙහිදී දැනුම් දෙනු ලැබීය.

මහාචාර්ය ජී.එල්. පීරිස් සහ මිලින්ද මොරගොඩ අමාත්‍යවරුන් දෙදෙනා උපදේශක කමිටුවේ භික්ෂූන් වහන්සේලා සමග මේ සම්බන්ධව එහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කළහ.

අමරපුර මහා සංඝ සභාවේ සභාපති කොටුගොඩ ධම්මාවාස, ඉනාමළුවේ සුමංගල සියම් නිකායේ රන්ගිරි දඹුලු පාර්ශ්වයේ මහානායක, ඉත්තෑපානේ ධම්මාලංකාර, කෝට්ටේ සාමග්‍රී සංඝ සභාවේ අනුනායක, කැලණිය රජමහා විහාරාධිපති ආචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත, කෝට්ටේ ශ්‍රී නාග විහාරාධිපති මාදුළුවාවේ සෝභිත, සිංහල ශබ්ද කෝෂයේ කර්තෘ අකුරැටියේ නන්ද, වැල්ලවත්ත ෆ්‍රෙඩ්රිකා රාමයේ විහාරාධිපති අහංගම ආනන්ද, මරදාන ශ්‍රී ලංකා විහාරාධිපති නාගොඩ අමරවංශ, කඩුගන්නාව සාම විහාරාධිපති ගොලුවාමුල්ලේ ඤාණානන්ද යන නාහිමිවරු ඇතුළු උපදේශක කමිටුවේ අනෙකුත් භික්ෂූන් වහන්සේලා ද අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් සුහද ගම්ලත් මහතා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ද මෙම අවස්ථාවට සහභාගි වූහ.



අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ පැවැති රැස්වීමට සහභාගි වූ මහා සංඝරත්නය ඉහළ ඡායාරූපයෙන් ද, මහාචාර්ය ජී.එල්. පීරිස් සහ මිලින්ද මොරගොඩ යන ඇමැතිවරුන් හා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් සුහද ගම්ලත් මහතා පහළ ඡායාරූපයෙන් ද දැක්වේ.